# සිංහල සංස්කෘතිය හා භික්ෂූන් වහන්සේ

මෙරට සිංහල ජාතිය නිර්මාණය කර දැනට අවුරුදු දෙදහස් හාරසියයක් පමණ වෙයි. එමෙන් ම ලෝකයේ පළමුවැනි ත්‍රෛකීය රාජ්‍යය ලෙස එකල ම මෙරට එක්සේසත් රාජ්‍යය පිහිටුවනු ලැබී ය. ඒ පඬුඅබා රජු දවස ය. පඬුඅබා රජු මහාවංසය ඇතුළු වංශකතාවලට අනුව පෙළපත් වශයෙන් සියයට හැත්තෑ පහක් ශාක්‍ය වංශයට අයත් යැයි සාමාන්‍ය ව්‍යවහාරයට අනුව නම් කිව හැකි ය. අද ඇතැමකුට මේ සියයට හැත්තෑපහ සියයට විසිපහ දක්වා අඩුකිරීමට අවශ්‍ය වෙයි.

ඒ කෙසේ වෙතත් පඬුඅබා (අබා නොවේ. අබා යනු ක්‍රිස්තුස් වහන්සේගේ බස වූ ඇරමික් බසින් පියා ය. පඬුඅබාට අබා යැයි ඇමතීම සිංහල සම්ප්‍රදාය නො වෙයි.) යනු මෙරට එකල තිබූ ගෝත්‍රවලින් ව්‍යාධ ගෝත්‍රය, එනම් වැදි ජනයාගේ ගෝත්‍රය, හැරෙන්නට අනෙක් සියළු ගෝත්‍ර එකතු කර සිංහල ජාතිය පිහිටුවීම ආරම්භකළ රජු ය. පඬුඅබා රජු සිංහ වාංශිකයන් සියළු දෙනා ලානය (ඝාතනය) නො කෙළේ ය. එතුමාගේ රාජ්‍යය හා ජාතිය නම්කෙරුණේ සිංහ වංශය නමිනි. එහෙත් එහි යක්ෂ සංස්කෘතියට වැදගත් තැනක් හිමිවිය.

සිංහල ජාතියේ චින්තනය ආර්‍ය නමින් හැඳින්වෙන ජනයා දඹදිවට පැමිණීමට පෙර තිබූ දඹදිව හා මෙරට තිබූ චින්තනයෙන් එතරම් වෙනස් නොවී ය. බුද්ධදහම ද ඇතිවූයේ දඹදිව එවැනි චින්තනයක ය. සිංහලයන් අතර බුද්ධදහම එතරම් පහසුවෙන් පැතිර ගියේ එබැවිනි. එහෙත් යක්ෂ ගෝත්‍රිකයන්ගේ චින්තනය මෙරට එකල පැවති අනෙක් ගෝත්‍රවල චින්තනයෙන් තරමක් වෙනස් බව පෙන්විය හැකි ය. පඬුඅබා රජු දවස යක්ෂ ගෝත්‍රිකයන් නිල වශයෙන් සිංහල ජාතියට ඇතුල් වුණ ද ඔවුන්ගෙන් යම් පිරිසක් ගැමුණු රජුගේ කාලයේ ද සිංහල ජාතියේ පූර්ණ සාමාජිකයන් නොවූ බව පැහැදිළි ය.

සිංහලයන් දේවානම්පිය තිස්ස රජු දවස නිල වශයෙන් බෞද්ධ වුව ද මෙරට රාජ්‍යය සිංහල බෞද්ධ වූයේ ගැමුණු රජු දවස ය. මෙයින් අදහස් කරන්නේ දේවානම් පියතිස්ස රජුට පෙර මෙරට බෞද්ධයන් නොසිටි බව නො වෙයි. ඇතැම් විට පඬුඅබා රජුගේ ආච්චි වූ භද්දකච්චනා ශාක්‍ය කුමරිය ද පඬුඅබා රජුගේ පියා වූ දිඝගාමිණී ශාක්‍ය කුමරු ද බෞද්ධ වන්නට ඇත. අද ඇතැමුනට පඬුඅබාගේ පීතෘත්වය වෙනස්කිරීමට අවශ්‍ය වී ඇත්තේ ඇයි ද යන්න මේ ඔස්සේ තේරුම්ගත හැකි ය.

සිංහල බෞද්ධ රාජ්‍යය පිහිටුවා සිය වස් කිහිපයක් ඇවෑමෙන් පස්වැනි සියවසේ දී පමණ තර්ජන දෙකකට මුහුණ පෑවේ ය. (මේ සියල්ල විදූසර පුවත්පතේ ලිපිවල විස්තර කෙරෙයි. ඒ ඩබ්ලිව්ඩබ්ලිව්ඩබ්ලිව්.කාලය.ඕර්ග් වෙබ් අඩවියෙන් හෝ විදූසර වෙබ් අඩවියෙන් හෝ බාගත හැකි ය.) එකල එක් පැත්තකින් දකුණු භාරතයේ ද්‍රවිඩ දේශයේ සොළී බලය වැඩෙන්නට විය. අනෙක් පැත්තෙන් ද්‍රවිඩ දේශයේ උතුරු කෙළවරේ පිහිටි ආන්ද්‍ර ප්‍රදේශයෙන් ථෙරවාදය නැතිවී යැම ඇරඹිණි. සිංහල බෞද්ධ රාජයේ ස්වෛරීභාවය, එක්සේසත් බව තර්ජනයට ලක්විය.

එහි ප්‍රතිඵලය වූයේ මහාවිහාරික භික්ෂූන් වගන්සේ ගේ ප්‍රධානත්වයෙන් සිංහල බෞද්ධ රාජ්‍යය රැකගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය වීම ය. උන්වහන්සේ ආන්ද්‍ර ප්‍රදේශයේ ථෙරවාදී භික්ෂූන් වහන්සේ ද සමගින් ථෙරවාදය ආරක්ෂාකිරීම සඳහා කතාව්‍යවහාරයෙහි එතරම් නොපැවති මාගධී ප්‍රාකෘතියෙන් බුද්ධදහම ලියා තැබූහ. පෙළ හෙවත් ග්‍රන්ථ ලියා තැබූ භාෂාව වූ ඒ භාෂාව පසු කලෙක පාලි නමින් හඳුන්වනු ලැබී ය. සිංහලයන්ගේ ප්‍රධාන කාර්යය බුද්ධදහම රැකීම බවට පත්විය. පොත්වල ලියා ඇති ධර්මයක් අමුතුවෙන් රැකිය යුත්තේ ඇයි දැයි රාජ්‍ය නොවන පඬුවකු (පණ්ඩුවකු) ඇසීමට ඉඩ ඇත. මෙහි දී රැකීම යනුවෙන් අදහස් කරන්නේ අල්මාරියක හෝ පෙට්ටගමක හෝ දමා රැකීම නොව ජීවමාන සංස්කෘතියක් ලෙස සිංහල බෞද්ධ සංස්කෘතිය ද රැගනිමින් බුද්ධ සසුන රැකගැනීම ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේ එවැනි පියවරක් නොගන්නට මෙරට යථාකාලයේ දී මහායාන බවටත් පසුව හින්දු බවටත් පත්වීමට තිබුණි. එපමණක් නොව බුද්ධ සසුන රැකීම සිංහලයන්ගේ කාර්‍යභාරය නොවන්නට මෙරට සොළී (දෙමළ) රටක් වීමට තිබුණේ සිංහලයන්ට රට රැකීම යනු බුද්ධසසුන රැකීම වූ බැවිනි. එසේ වී නම් අප රට ද දකුණු භාරතයේ රටවල් මෙන් තවත් ද්‍රවිඩ හින්දු රටක් වීමර තිබුණි. එහෙත් මහාවිහාරික භික්ෂූන් වහන්සේ ගත් දූරදර්ශී

© Prof. Nalin De Silva

පියවර හේතුවෙන් සිංහල බෞද්ධ රාජ්‍යය හා එහි ස්වෛරීභාවය නොනැසී රැකිණි. අද විවිධ පඬියන් මහාවිහාරයට පහර දෙන්නේ කුමක් නිසා ද යන්න තේරුම් ගත හැකි ය. වෙනත් සංස්කෘතියක නොමැති ආකාරයට රට දැය සමය වෙනුවෙන් කටයුතු කිරීමට අප යොමු වී ඇති බව අමතක නොකළ යුතු ය.

එදා මහාවිහාරික භික්ෂූන් වහන්සේ දමන ලද පදනම කෙතරම් ශක්තිමත් ද යන්න පසුගිය අවුරුදු දහසක පමණ ඉතිහාසයෙන් ද පෙන්නුම් කෙරෙයි. සිංහලයන් ගේ සිංහල ජාතියේ හා සිංහල රාජ්‍යයේ ස්වෛරීභාවය, ස්වාධීනත්වය ආදී සියල්ල රැකී ඇත්තේ සිංහලයන් තුළට කාවද්දන ලද බුදු සසුන රැගැනීම සිංහලයන්ගේ කාර්යභාරය වේය යන හැඟීම මත ය. අග්නිදිග ආසියාවේ බලය පිහිටුවා ගත් සොළී අධිරාජයාට මුළු ලංකාව ම යටත්කර ගැනීමට නොහැකි විය. පසුව කිසිම යුරෝපීය අධිරාජ්‍යවාදී රටකට අප රට මුළුමනින් ම යටත්කර ගැනීමට නොහැකි විය. ඉංගිරිසින් සිංහල රාජ්‍යය ලබාගත්තේ යුද්ධයකින් ජයගැනීමෙන් නොව ගිවිසුමක් මගිනි.

උඩරට ගිවිසුම නමින් හැඳින්වෙන මේ ගිවිසුම සිංහල ඉංගිරිසි ගිවිසුම ලෙස හැඳින්විය යුතු ය. සිංහල ඉංගිරිසි ගිවිසුමේ ප්‍රධාන වගන්ති දෙකක් වෙයි. එක් වගන්තියකට අනුව බ්‍රිතානීන් බුදුසසුන රැකිය යුතු ය. ක්‍රිස්තියානි යටත්විජිතවාදීන්ගෙන් බුදුසසුන රැකගැනීමට වගන්තියක් ලියවාගැනීම සුළුපටු කරුණක් ලෙස සැලකිය නො යුතු ය. ඒ වගන්තියෙන් කියැවෙන්නේ සිංහල ජීව ගුණය ය. ඒ වගන්තිය එසේ ලියැවුණ ද එහි නිර්මාතෘවරු පඬියන්ගේ ගර්හාවට ලක් වී ඇති මහාවිහාරික භික්ෂූන් වහන්සේ ය. මහාවිහාරික භික්ෂූන් වහන්සේ නොවන්නට ඒ වගන්තිය ඇතුළත් නොවනවා පමණක් නොව අපේ අභිමානය ද නැති වී යෑමට තිබුණි. අපේ මුළු ඉතිහාසය ම විකාශය වී ඇත්තේ සිංහලයන්ගේ කාර්යභාරය බුදුසසුන රැකීම යන ආකල්පය වටා ය.

සිංහල ඉංගිරිසි ගිවිසුමෙහි ඇති දෙවැනි ප්‍රධාන වගන්තිය නම් මෙරට සිංහල නීතිය අනුව කරවිය යුතු ය යන්න ය. සිංහල නීතිය ලිඛිත නීතියක් නොවේ. ඉංගිරිසිහු අලිඛිත සිංහල නීතිය අනුව රට නොකෙරවූහ. ඔවුහු අවුරුද්දක් දෙකක් ගතවීමට පෙර ගිවිසුම හැඬූහ. අපේ නිදහස් සටන් ඇරඹිණි. අද වන තුරුත් බටහිරයන්ට එරෙහි වූ සටන නැවතී නැත. එයට හේතුව අපට තවම පූර්ණ නිදහස නොමැති වීම ය. රාජකාරි ක්‍රමය (ඒ ඊනියා වැඩවසම් ක්‍රමයක් නො වේ) අහෝසි කිරීම කෝල්බෘක් කැමරන් යෝජනා ක්‍රියාත්මක කිරීම පසුව ඉංගිරිසි පරිපාලන තන්ත්‍රයක් හා අධිකරණයක් හා ව්‍යවස්ථාදායක සභා පිහිටුවීම ඔස්සේ සිංහල නීතිය වෙනුවට මෙරට සුද්දාගේ නීතිය රජකරවා සිංහල ඉංගිරිසි ගිවිසුම ත්‍රස්තවාදී ආකාරයකින් කඩා බිඳ දැමූහ.

සිංහල නීතිය යනු සිංහල සිරිත් විරිත් ය. සිංහල රජ දවස සිරිත්ලේනා යනු අද අර්ථයෙන් නම් නීතිපති විය. සිංහල සිරිතට, එනම් සිංහල බෞද්ධ සිරිතට, අනුව භික්ෂූන් වහන්සේ රජුට අනුශාසනා කළහ. උන්වහන්සේ රජු ඉදිරියේ නො නැගිටියහ. රජු උන්වහන්සේ අබියස නැගී සිටියේ ය. මෙය ථෙරවාද සංස්කෘතියේ මූලික ලක්ෂණයකි. නිග්‍රෝධ සාමණේරයන් වහන්සේ සුදුසු අස්නක් බලා රජු සිටිය දී ම අශෝක රජුගේ සිංහාසනයෙහි වාඩිවූහ. උන්වහන්සේ එසේ කෙළේ උන්වහන්සේට වඩා ජ්‍යෙෂ්ඨයකු එතැන නොසිටි බැවිනි. සිංහල ථෙරවාද බෞද්ධ සංස්කෘතියෙහි භික්ෂූන් වහන්සේ කිසිම ගිහියකු ඉදිරියේ නො නැගී සිටියහ. භික්ෂූන් වහන්සේ නමක නැගී සිටියේ උන්වහන්සේට වඩා උපසම්පදාවෙන් වැඩි වෙනත් භික්ෂූන් වහන්සේ නමක ඉදිරියේ පමණ ය.

අප මහාවිහාරික සම්ප්‍රදාය රැකගත යුතු ය. සුද්දාගේ රටේ නම් කැන්ටබරියේ ආච් බිෂොප්තුමා ද රජු ඉදිරියෙහි නැගී සිටී. එලිසබෙත් වින්ඩ්සර මහත්මියගේ මෞලි මංගල්‍යය පිළිබඳ චිත්‍රපටිය මා නැරඹුවේ තුන්වැනි පංතියේ ඉගෙන ගනිද්දී ය. ආච් බිෂොප්තුමා එතුමාගේ රැජින වූ එලිසබෙත් වින්ඩ්සර මහත්මියට පිදූ ගෞරවය කුඩා දරුවකු ලෙස වුව ද මම විමතියෙන් බලා සිටියෙමි. එතුමා එසේ කෙළේ ඇයි දැයි ගෙදර ගිය විගස මවගෙන් ඇසීමි. ඒ සිංහල සම්ප්‍රදාය නොවන බව මට මම එකල ද වැටහිණි. කුඩා දරුවනට වුව ද එවැනි වැටහීමක් ලැබෙන්නේ සිංහල බෞද්ධ සංස්කෘතියේ ආධාරයෙනි. කුඩා දරුවන් වියපත් වී පාසලට හා විශ්වවිද්‍යාලයට ගිය පසු අධ්‍යාපනයෙන් ඔවුන්ගේ මොළ සෝදනු ලැබෙයි. ඔවුන් ඉන්පසු දන්නේ වෙස්ට්මිනිස්ටර සම්ප්‍රදාය හා වෙනත් විජාතික සම්ප්‍රදායන් ගැන පඬිවදන් දෙඩවීමට ය. පඬිවදන් පසෙක ලා රටේ නිදහස වෙනුවෙන් මහාවිහාරික සම්ප්‍රදාය ඉදිරියේදීත් රැක ගනිමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva